**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.3 (ඌ) | රජය සතු වටිනා දේපළ පැවරීමේදී ඒ ගැන සොයාබලා පැවරිය යුතු දේපළ පමණක් විධිමත් පරිදි පැවරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | 3.6 (ඌ) |
| 3.3 (එ) | රජයට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අල්ලා ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | 3.6 (එ) |
| 3.7 (ඈ) | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, රජයට සිදුවී ඇති අලාභය අයකරගත යුතු වීම. | 3.7 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i).** | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් දෙපාර්තමේන්තු පොත් අනුව රු.12,626,297 ක් වුවත්, එය මූල්‍ය ප්‍රකාශනවල රු.11,539,037 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.1,087,260 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වෙනස්කම් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල නිවැරදි කිරීම 2023 දෙවන කාර්තුවේදී සිදුකරන බව දන්වමි | මූල්‍ය ප්‍රකාශනවල සහ දෙපාර්තමේන්තු පොත්වල ශේෂයන් ගලපා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii).** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස සම්බන්ධයෙන් ලබාදී ඇති පිරිවැය තක්සේරු වාර්තා අනුව, නිල නිවාස 34 ක තක්සේරු වටිනාකම රු.97,575,925 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම වටිනාකම රු.81,697,976 ක් ලෙස දැක්වීමෙන් රු.15,877,948 ක වටිනාකමක් අඩුවෙන් දක්වා තිබුණි. | රු.81,697,976 ක් ලෙස ලබාදුන් ජංගම නොවන වත්කම් වාර්තාව අනුව ගිණුම්ගත කළ වටිනාකම නිවැරදි බව දන්වමි. | නිල නිවාසවල නිවැරදි තක්සේරු වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |
| **(iii).** | මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් ගිණුමේ නේවාසික නොවන ගොඩනැගිලි ගිණුමේ සහ යන්ත්‍රෝපකරණ ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති අවසාන ශේෂයන් හා 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂයන් අතර පිළිවෙලින් රු.3,106,940 ක් වැඩියෙන්ද, රු.32,180 ක් අඩුවෙන්ද වටිනාකම් දක්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල ආරම්භක ශේෂයට ගැලපුම් කරඇති බැවින් වෙනස හටගෙන ඇත. | මූල්‍ය නොවන වත්කම් ගිණුමේ ආරම්භක ශේෂයන් සහ ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයන් වෙනස් නොවිය යුතුය. |
| **(iv).** | කුලියාපිටිය (නැගෙනහිර), උඩුබද්දාව, මාස්පොත, මල්ලවපිටිය, රස්නායකපුර හා ගල්ගමුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් ස්ථාපිත කර ඇති ඉඩම්වල වටිනාකම තක්සේරු කර දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතී. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| **(v).** | රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් සඳහා ලබාදී තිබූ ජල බවුසර් සහිත ලොරි රථ 04 පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී පවරාගැනීමට කටයුතු කරන අතර, පවරාගත් වහාම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබාදී තිබූ වාහන තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(vi).** | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණු ට්‍රැක්ටර් හා බවුසර් ටේලර් රථ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පවරා දීමට කටයුතු කර තිබුණ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් හා බවුසර් ටේලර් රථ 25 ක් සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් වෙත ලබාදී තිබූ ට්‍රැක්ටර් හා ටේලර් රථ 20 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණ එම වත්කම්වල අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ත්‍රිපුද්ගල කමිටුවක් පත්කොට තක්සේරු කිරීමට නියමිත අතර, තක්සේරු කටයුතු අවසන් වූ වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | වෙනත් අමාත්‍යාංශවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී ඇති වාහන පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| **(vii).** | වැය විෂය අංක 2509 යටතේ ගම සමඟ පිළිසඳර වැඩසටහන මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදුකරන ලද ගොඩනැගිලි, සේවා පියස / නිල සෙවන ඇතුළු වෙනත් ඉදිකිරීම් සුදුසු පරිදි පවරාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම්වල අයිතිය අදාල ආයතන වෙත පවරා දීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතින ගොඩනැගිලි පවරාගෙන අගය තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| **(viii).** | නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අලුත්ම තත්ත්වයේ පවතින අංග සම්පූර්ණ නිල නිවස රු.6,229,500 ක වටිනාකමකට තක්සේරු කර ඇතත්, එම තක්සේරු වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | රු.6,229,500 කට තක්සේරු කොට ඇති අතර, මෙම වටිනාකම ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | අංග සම්පූර්ණ නිල නිවාස තක්සේරු කර ඇතත්, වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි ගිණුම් ගත කළ යුතුය. |
| **(ix).** | නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගම සමඟ පිළිසඳර වැඩසටහන සඳහා 272-1-1-0-2509 වැය විෂය යටතේ වර්ෂය අවසානයට තවදුරටත් එළඹ තිබූ රු.22,398,664 ක බැරකම් වටිනාකම භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල දක්වා තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | 2022 පළමු කාර්තුවේදී පමණක් ප්‍රතිපාදන ලැබී ඇති අතර, පළමු කාර්තුවේදීම සියලු වියදම් සිදුකර අවසන් කරඇති බැවින් තවදුරටත් එළඹ තිබූ බැරකම් නොතිබුණි. | බැරකම් වටිනාකම් දැක්වීමේදී භාණ්ඩාගාරය සමග නිසි කළමනාකරණයකින් යුතුව කටයුතු කළ යුතුය. |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

**---------------------------**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------- | --------------------------------- | ------------ |
| (i). | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් දීර්ඝකාලීනව භාවිතයට ගනු ලබන නිල නිවාස 07 ක් රු.23,780,480 කට තක්සේරු කර ඇති බව දක්වා ඇතත්, අදාල වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණ අතර, එයට අදාල ස්ථාවර වත්කම් උපලේඛනවල ඇති ශේෂයන් සනාථ කර ගැනීම සඳහා විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ගත කර ඇති කාර්යාලවල හා මූල්‍ය ප්‍රකාශන තුළ ගොඩනැගිලි තක්සේරු වටිනාකම ඇතුළත් කර තිබුණි. | නිල නිවාස ශේෂයන් සනාථ කිරීම සඳහා උප ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ii). | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍ර තුළ පිහිටා ඇති නිල නිවාස 07 ක් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් භාවිතයට ගනිමින් පැවති අතර, මෙම නිල නිවාස තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණ අතර, එයට අදාල උපලේඛනවල ශේෂයන් සනාථ කර ගැනීම සඳහා විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ පිහිටි නිල නිවාස දැනටමත් ගිණුම් ගත කර තිබුණි. | ප්‍රාදේශීය ලේකම්වරු භාවිතයට ගන්නා නිල නිවාස තක්සේරු කර ශේෂයන් සනාථ කිරීම සඳහා උප ලේඛන ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 වියදම් කළමනාකරණය**

**-----------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------ | -------------- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ACA-2(ii) ආකෘතියේ දක්වා තිබූ වැය විෂයයන් 02 ක් සඳහා එකතුව | අධි ඇස්තමේන්තු නොකළ බව දන්වා සිටින අතර, ප්‍රතිපාදන ඌණතා ඇති වැය | මනා සැලසුමකින් හා පාලනයකින් යුතුව ඇස්තමේන්තු සැකසිය |

| | | |
|---|---|---|
| රු.34,632,783 ක ඉතිරියක් සම්බන්ධයෙන් මනා සැලසුමකින් හා පාලනයකින් තොරව අධි ඇස්තමේන්තු සැකසීම හේතුවෙන් ඉතිරි වී තිබූ බැවින් ඉදිරිපත් කර තිබූ හේතුන් විගණනයේදී පිළිගත නොහැකි විය. | විෂයයන් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් මත මුදල් රෙගුලාසි 66 මඟින් ප්‍රතිපාදන මාරු කර තිබුණි. | යුතුය. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනුලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබූ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ජේදය ප්‍රකාරව සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක්ම සිය මුදල් වර්ෂයට අදාලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ක්‍රියාවට නැංවිය යුතු වුවද, එම ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති අරමුණු ඉටු නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශ 13 කින් හා දෙපාර්තමේන්තු 14 කින් ලද ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට එකතුව රු.මිලියන 1,239,453 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සීමා කිරීම, ඉන්ධන අර්බුදය හමුවේ සංචරණය සීමාවීම, ඇස්තමේන්තුවට වඩා අඩු මුදල් ප්‍රමාණයක් වියදම් වීම, ක්ෂේත්‍ර රාජකාරී සීමා කිරීම නිසා ගමන් වියදම් ප්‍රතිපාදන ඉතිරි වීම, සැලසුම් කළ පරිදි වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම වැනි කරුණු බලපා තිබුණි. | වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලින් ලබාදෙන ප්‍රතිපාදනයන් කල් වේලා ඇතිව ලබාගැනීම සඳහා නිසි වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වීම සහ ලැබෙන ප්‍රතිපාදන හැකිතාක් දුරට උපයෝජනය කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශ 05 කින් වැඩසටහන් 05 ක් සඳහා ලද මුළු ප්‍රතිපාදන මුදල වූ රු.මිලියන 18,940.4 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් උපයෝජනයට ගෙන නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති අරමුණු ඉටුවී නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් වෙනස්වීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සීමා කිරීම වැනි කරුණු බලපා තිබුණි. | අමාත්‍යාංශවලින් ලැබෙන ප්‍රතිපාදනවලින් ව්‍යාපෘති අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| | XXIV පරිච්ඡේදයේ 14.11 වගන්තිය | 10,160,998 | වැටුප් ණය අත්තිකාරම් ලබා ඇති නිලධාරියෙකු සේවය අවසන් කළහොත්, ණය මුදලෙන් එතෙක් නොගෙවා ඇති ශේෂය එම නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිතයෙන් හෝ නීත්‍යානුකූලව අයකර ගැනීම සඳහා 23 වැනි පරිශිෂ්ඨයේ වූ විශ්‍රාම වැටුප පරිවර්තනය කිරීම සඳහා දෙනු ලබන අවලංගු කළ නොහැකි ප්‍රකාශයක් ලබාගත යුතු වුවද, වැටුප් ණය අත්තිකාරම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා බිංගිරිය, පඩුවස්නුවර (නැගෙනහිර), ගල්ගමුව හා මාස්පොත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 හි නිලධාරීන් 51 දෙනෙකු සඳහා අවස්ථා 70 කදී ලබාදී තිබූ වැටුප් ණයවලට අදාලව එවැනි ප්‍රකාශයක් ලබාගෙන නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැටුප් ණය ලබා ගැනීමේදී අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශයක් ලබාගැනීමට කටයුතු කර ඇති බව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා එම ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | වැටුප් අත්තිකාරම් නීත්‍යානුකූලව අයකර ගැනීමේදී අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශයක් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>-------------------------- | | | |
| **i.** 2022 මාර්තු 11 දිනැති අංක 03/2021(1) දරන චක්‍රලේඛය | අංක 1589/30 හා 2009 පෙබරවාරි 20 දිනැති (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පල කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති XIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථානමාරුවීම් සම්බන්ධ විධිවිධානවලට අනුව සිදුකළ යුතුව තිබුණද, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් 2022 ජුලි මස 01 වන දින සිට ක්‍රියාත්මක කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක නිලධාරීන් 210 දෙනෙකු වර්ෂ 06 සිට වර්ෂ 22 දක්වා කාලයක් එකම කාර්යාලයේ සේවයේ නියුක්ත වී තිබුණි. | මෙම නිලධාරීන් එකම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කරන නමුත් කොට්ඨාශයේ වසම් අතර ස්ථාන මාරුවීම් සිදුකරනු ඇත. | චක්‍රලේඛ පරිදි සංවර්ධන නිලධාරීන්ගේ ස්ථානමාරුවීම් ක්‍රියාත්මක කළ යුතුය. |
| **(iii) රාජ්‍ය මුදල් චක්‍රලේඛ**<br>-------------------------- | | | |
| i. 2021 ජනවාරි 11 දිනැති හා අංක MF/NDP/01/2021 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය සහ 2021 පෙබරවාරි 10 දිනැති හා අංක MF/NDP/01/2021(i) දරන මුදල් අමාත්‍යාංශ | චක්‍රලේඛයන්හි සඳහන් ක්ෂේත්‍ර 13 ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ යුත්තේ අදාල මන්ත්‍රීවරයා විසින් බැවින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා යෝජනා වෙන්කර ලබාදීමේ හැකියාව ඇත්තේ අදාල | විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ චක්‍රලේඛවල සඳහන් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රතිපාදන වෙන් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලේකම්වරයාගේ චක්‍රලේඛය | | | මන්ත්‍රීවරුන්ට පමණි. | |
| **ii.** | 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක.MF/PD/01/2021 චක්‍රලේඛයේ 2.1 ඡේදය | 88,241,505 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ සම්පූර්ණ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක අවමයක් ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි හා ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීමට සහය වන භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා වෙන් කළ මුලු ප්‍රතිපාදනයෙන් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කර තිබුණේ සියයට 24 ක් වූ රු.21,173,295 ක් පමණි. | මෙම ව්‍යාපෘතිවලට අදාල යටිතල පහසුකම් සහ මිලදී ගැනිම් ව්‍යාපෘතිවලට අදාලව ප්‍රතිශත ගණනය කළ යුත්තේ අදාල මන්ත්‍රීවරයාට හිමි ප්‍රතිපාදනයට අදාලව පමණි. | මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ නියමයන්ට අනුව අපේක්ෂිත ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| iii. | 2021 ජනවාරි 11 දිනැති සහ අංක MF/NPD/01/2021 දරන මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයේ 2.4 ඡේදය | 24,764,749 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ජනගහනය, දරිද්‍රතාවය සහ භූමි ප්‍රමාණය යන සාධක පදනම් කරගෙන ප්‍රතිපාදන බෙදීයන ලෙස ව්‍යාපෘති තෝරා ගෙන ක්‍රියාත්මක කළ යුතු වුවත්, 2021 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක තෝරාගත් සමිති 229 ක් සඳහා අවස්ථා ගණනාවකදී විවිධ භාණ්ඩ ලබාදී තිබූ අතර, 2018 සිට 2021 වර්ෂය දක්වා තෝරාගත් සමිති 191 ක් වෙත සෑම වර්ෂයකදීම භාණ්ඩ බෙදා දී තිබුණි. | ප්‍රතිපාදන බෙදීයන ලෙස ව්‍යාපෘති තෝරාගෙන ක්‍රියාත්මක කළ යුතු බව චක්‍රලේඛයේ දක්වා ඇතත්, ඊට අදාල යෝජනා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අභිමතය පරිදි ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව විමධ්‍යගත මන්ත්‍රී ප්‍රතිපාදන බෙදීයන පරිදි ව්‍යාපෘති තෝරාගත යුතුය. |

**(iv) වෙනත් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| i. **ස්වදේශ කටයුතු හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි**<br>➢ 1993 ජනවාරි 13 දිනැති සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් ඇමතූ ලිපිය<br>➢ 2003 ජනවාරි 06 දිනැති ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතූ ලිපිය<br>➢ 2006 මාර්තු 21 දිනැති HA/DA/12/27 දරන ලිපිය | සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් තම නිල නිවසෙහි අනිවාර්යයෙන්ම පදිංචි විය යුතු වුවද, වාරියපොල හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු අංග සම්පූර්ණ තත්ත්වයේ පවතින නිල නිවාස පදිංචිය සඳහා යොදා නොගැනිම හේතුවෙන් නිල නිවස විනාශවෙමින් දිරාපත්වන තත්ත්වයට පත්ව තිබුණි. | වාරියපොල නිල නිවාසයේ වහලය අබලන්ව ඇතත්, විවිධ වැඩසටහන් පවත්වන බවත් පදිංචියට නුසුදුසු බවත් දක්වා ඇති අතර, නාරම්මල ප්රාදේශීය ලේකම්තුමිය පදිංචි ස්ථානයේ සිට කි.මී.7 ක දුරක සිට රාජකාරියට පැමිණීම හේතුවෙන් නිල නිවසේ පදිංචි වී නොතිබුණි. | නිල නිවාසවල පදිංචි වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ii. 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව කාර්ය පටිපාටි රීති 01 වන කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 202 වගන්තියේ විධිවිධානවලට අනුව ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පටිපාටියේ 2.2.2.ඡේදය | එකම සේවා ස්ථානයේ වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් කළ යුතුවුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක 2022 දෙසැම්බර් 31 දින වන විට වසර 06 සිට වසර 25 දක්වා සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් 258 දෙනෙකු සම්බන්ධයෙන් යථෝක්ත ස්ථානමාරු පටිපාටිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සුදුසු අනුප්‍රාප්තිකයින් නොමැති වීම සහ විශේෂ පුහුණු වීම් ලැබූ නිලධාරීන් සමහර අවස්ථාවල ස්ථාන මාරුවීම්වලට යටත් නොවන අතර, අනෙක් සියලු නිලධාරීන් හට රාජකාරී කටයුතුවලට බාධා නොවන පරිදි ස්ථාන මාරුවීම් ලබාදී තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව ඒකාබද්ධ සේවයේ නිලධාරීන් ස්ථානමාරු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| iii. | 2021 පෙබරවාරි 11 දිනැති අංක 2021/03 දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 04 ඡේදය | සමෘද්ධි සහනාධාරලාභීන් තෝරාගැනීමේදී පවුලේ ආර්ථික තත්ත්වය, වත්කම්, නිවසේ තත්ත්වය ආදිය සළකා බැලිය යුතු බව දක්වා තිබුණද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ප්‍රතිලාභීන් තෝරාගැනීමේදි මෙම කරුණු අවධානයට ලක් නොකර ප්‍රතිලාභීන් තෝරාගෙන තිබුණි. | පුද්ගල ආදායම් මට්ටම පිළිබඳව වඩාත් සැලකිලිමත් බවක් දක්වා සහනාධාර පිළිබඳ කටයුතු සිදුකරන ලෙසට ග්‍රාමීය කමිටුවලට දන්වා තිබුණි. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වේ චක්‍රලේඛ පරිදි ප්‍රතිලාභීන් තෝරාගත යුතුය. |

## 2.4 වංචනික ස්වරූපයේ ගනුදෙනු

---------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ------------- |
| (i) | බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරිණියක වෙත 2019 මාර්තු 19 සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව අතිරේක පාරිශ්‍රමිකයක් ලෙස රු.66,146 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. මාස 05 ක කාලයක් තුළ අවස්ථා 05 කදී එයින් රු.56,706 ක මුදලක් අයකර ගෙන ඇතත්, ඉතිරි රු.9440 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර, මේ සම්බන්ධයෙන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉතිරි මුදල ඉදිරියේදී ඉතා කඩිනමින් ගෙවා අවසන් කරන බව ප්‍රාදේශීය ලේකම්වරිය විසින් දන්වා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු අතර, අදාල නිලධාරීන්හට විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයින් / වැන්දඹුවන් 259 දෙනෙකු වෙත එකතුව රු.52,581,622 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණ අතර, 2022 මැයි මස සිට දෙසැම්බර් මස දක්වා එයින් තවදුරටත් රු.30,037,359 ක මුදලක් අය විය යුතුව තිබුණි. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම මාසිකව අයකරන බව සහ තවදුරටත් අයකර ගැනීමට ඇති මුදල් මාසිකව නිසි පරිදි අයකරනු ඇත. | විශ්‍රාමිකයින් සඳහා ගෙවන ලද වැඩිපුර මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු අතර, අදාල වගකිව යුතු නිලධාරින් නිශ්චය කොට එම නිලධාරීන් හට වගකීම් පැහැර හැරීම සම්බන්ධ කටයුතු කළ යුතුය. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රියදුරුවරයකුගෙන් අයවීමට තිබූ ආපදා, උත්සව හා පාපැදි ණය වටිනාකම් පිළිවෙලින් රු.145,568 , රු.7,500 , රු.1,200 ලෙස එකතුව රු.154,268 ක වටිනාකම විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට නියමිත බව දැන්වුවද එසේ අයකර ගැනීමට කටයුතු කර නොමැතිව විශ්‍රාම පාරිතෝෂිත මුදල නිදහස් කර තිබුණි. | ඉදිරියේදී මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට නියමිතව ඇත. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 (1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.6 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 23 ක ගිණුම් අංක 6000-0-0-16-0-42 යටතේ කොන්ත්‍රාත් රැඳවුම් මුදල් එකතුව රු.126,265,499 ක් වර්ෂ 02 සිට 05 දක්වා කාලයක් නිදහස් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | කොන්ත්‍රාත් රැඳවුම්වලට අදාලව පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති මුදල් නිදහස් කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අක් මුදල් ඉල්ලුම් කළ ද මුදල් නොලැබීම මත රැඳවුම් මුදල් නිදහස් කිරීමට නොහැකි විය. | කල් ඉකුත් වූ තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා ලැබුණු එකතුව රු.206,188,466 ක මුදලින් රු.101,282,480 ක මුදලක් වර්ෂ 05 කට අධික කාලයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විසින් ගිණුම් අංක 6000-0-0-17-0-13 යටතේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබීමෙන් ඉඩම්වල භුක්තිය භාරගෙන, අත්පත් ක්‍රියාවලිය අවසන් කර වන්දි ගෙවීම් ප්‍රමාද වී තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ නෛතික කටයුතු ආරම්භ කිරීම හේතුවෙන් ගෙවීම් කිරීමට නොහැකිව තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි වෙනුවෙන් ලැබූ මුදල් කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ඇ) | කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසර 05 ට වැඩි පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.93,535,533 ක්ද, වසර 04 ට වැඩි ශේෂය රු.921,070 ක්ද විය. මෙම ශේෂයන් ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය සහ අයෝජන මණ්ඩලයේ කර්මාන්ත සංකීර්ණය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් තැන්පත් කරන ලද ශේෂයන් වූ අතර, ඒවා වසර ගණනාවක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් නොවූ තැන්පතු සඳහා නෛතික කටයුතු අවසන් වූ විගස එම තැන්පතු ගෙවීම් කිරීමට මහා භාණ්ඩාගාරයෙන් අක් මුදල් ඉල්ලුම්කර ගෙවීම් කරනු ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි වෙනුවෙන් ලැබූ මුදල් කඩිනමින් නිරවුල් කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

\

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්ම තුළ ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල දක්වා නොතිබුණි. එසේම චක්‍රලේඛයේ 03 ඡේදය (ආ) පරිදි එම සැලැස්ම වාර්ෂික අයවැය ඇස්තමේන්තු පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්මක් විය යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අනුව ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කරන අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරන බැවින් ඊට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරනු ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිත්තවැල්ල ග්‍රාම නිලධාරී වසමේ සී/ස තිත්තවැල්ල මැටි කාර්මික ග්‍රාමීය කර්මාන්ත සමිතිය වෙත කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් 2009 වර්ෂයේදී රු.866,759 ක් වටිනා උපකරණ ලබාදී තිබුණ අතර, 2021 වර්ෂයේදී වේවැල්, පිත්තල, මැටි, ලී බඩු, කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.4,698,456 ක ඉදිකිරීම් සිදුකර තිබුණි. 2022 වර්ෂයේදීද කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිපාදන යටතේ රු.1,073,552 ක අලුත්වැඩියාවන් සිදුකර ඇතත්, මධ්‍යස්ථානය පවත්වාගෙන යන ඉඩමේ අයිතිය තහවුරු කර නොතිබුණි. මධ්‍යස්ථානය සතු උපකරණ ප්‍රතිලාභීන් පොදුවේ භාවිතා කිරීමක් නිරීක්ෂණය නොවුණ අතර, නිෂ්පාදන කටයුතු හා උපකරණ එක් පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. එසේම ලබාදී තිබූ රු.497,224 ක | ඉදිරියේදී මෙය විධිමත් පරිදි සිදුකරගෙන යාම සඳහා තිත්තවැල්ල මැටි භාණ්ඩ කාර්මිකයින්ගේ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමූපකාර සමිතියට උපදෙස් ලබා දී තිබුණි. | ව්‍යාපෘති සඳහා යොදවා ඇති මුදල් ඵලදායී ආකාරයට යෙදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපකරණ වර්ෂ ගණනාවක සිට භාවිතයට නොගෙන නිෂ්කර්යව පැවතුණ අතර, ප්‍රතිලාභීන්ට පෞද්ගලිකව ලබාදී තිබූ මැටි ඇඹරුම් යන්ත්‍රවල විවිධ දෝෂ හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණි. | | |
| (ආ) | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාලව රු.6,947,091 ක ප්‍රතිපාදන යටතේ ඉදිකර තිබූ ග්‍රාමීය වොලිබෝල් ක්‍රීඩාංගන 04 ක් භාවිතයට නොගෙන නඩත්තුවකින් හා භාවිතයකින් තොරව වල් බිහිවී නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රාදේශීය සභාව සමඟ සම්බන්ධව ක්‍රීඩා පිටි එළිපෙහෙලි කර බිම සකස් කර භාවිතයට ගත හැකි ආකාරයට සකස් කර ඇත. | ව්‍යාපෘති ඵලදායී ලෙස අරමුණු ඉටු වන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ හණ වගා ව්‍යාපෘතියක් සඳහා රු.940,760 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ අතර, රු.581,250 ක වටිනාකමකට හණ පැල 12,500 ක් සිටුවීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද, ආයතනයේ නිලධාරීන් විසින් හණ පැල 20,000 ක් සිටවා ඇති බවට ව්‍යාජ තොරතුරු වාර්තා ඉදිරිපත් කර තිබූණු අතර, භෞතිකව පරීක්ෂා කිරීමේදී හණ පැල අදාල ප්‍රමාණයක සිටුවා නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස ක්ෂේත්‍ර පරීක්ෂණවලදී නිරීක්ෂණය වී ඇති අතර, අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැති බැවින් අවසන් ගෙවීම් කිරීමට ප්‍රථම වැඩිදුරටත් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත්කර එහි නිර්දේශ අනුව ගෙවීම් නවතා ඇත | ව්‍යාපෘති ඵලදායී ලෙස අරමුණු ඉටු වන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා 2017,2018,2019 වර්ෂවල අදියර I | රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් කුඩා කණ්ඩායම් ක්‍රියාවලිය සාර්ථකව සිදුකළ නොහැකි | ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ |

| | | | |
|---|---|---|---|
| | යටතේ රු.178,789,500 ක මුදලක්ද, 2022 දෙසැම්බර් 31 දින වන විට අදියර II යටතේ රු.62,680,000 ක මුදලක්ද වශයෙන් එකතුව රු.241,469,500 ක මුදලක් ප්‍රතිපාදන වශයෙන් ලබාදී තිබුණි. මෙම ව්‍යාපාරයේ අරමුණ 2020 වන විට ප්‍රජාපාලිත හා නිෂ්පාදන සේවා අභිමුඛ ග්‍රාම නිලධාරී වසම් 5,000 ක් ඇති කිරීම තුළින් එකී ග්‍රාමයන් තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම විය. ඒ අනුව ජනතාවගේ මාසික ආදායම දෙගුණ කිරීම මෙම වැඩසටහනේ අරමුණක් වුවද, එය ඉටුවී නොතිබුණු අතර, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අදියර I යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 ක් තුළ ග්‍රාම ශක්ති සමිති 90 ක්ද, අදියර II යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ක් තුළ ග්‍රාම ශක්ති සමිති 160 ක්ද වශයෙන් එකතුව ග්‍රාම ශක්ති සමිති 250 ක් වෙත ලබාදුන් රු.241,469,500 ක මුදලින් 2022 දෙසැම්බර් 31 වන විට රු.109,094,352 ක මුදලක් නිශ්කාර්යව පැවතුණි. | වීම, රැස්වීම් පැවැත්වීමට නොහැකිවීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සංකීර්ණභාවය හේතුවෙන් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කළ නොහැකි විය. | අරමුණු ඵලදායී ලෙස ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පොතාන ග්‍රාම නිලධාරී වසමේ කිරි හා එළවළු, පළතුරු නිෂ්පාදන ගම්මානයක් වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා රු.4,465,465 ක වියදමක් දරා කිරිගවයින්, ගව ගාල් ජල සම්පාදන උපකරණ හා පළතුරු පැල ලබාදී තිබුණද, ගව ගාල් බොහොමයක් ඌණ උපයෝජිත තත්ත්වයේ තිබූ අතර, ලබාදී තිබූ පළතුරු පැල බොහෝ ප්‍රමාණයක් විනාශ වී තිබූ අතර, ඉතිරි පැල අස්වනු ලබාගත නොහැකි තත්ත්වයේ පැවතුණි. | මෙම ප්‍රදේශයේ සතුන්ට ගවගාල් තුළ ආහාර ලබාදීම අවම වශයෙන් සිදුකරන අතර, රාත්‍රී කාලයට හා වර්ෂාධික කාලවලදී සතුන් ගාල් තුළ රඳවන බැවින් ගවගාල් ප්‍රයෝජනයට ගනු ලබන බවත්, විනාශ වූ පැල වෙනුවට නව පැල ලබාගෙන සිටුවන ලෙස උපදෙස් ලබා දී තිබුණි. | ව්‍යාපෘති ඵලදායී සහ අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩදොඹේ වසමේ රු.4,875,000 ක වියදමක් දරා සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ කිලෝපේර හා වැල්දොඩම් ඒකාබද්ධ වගාවක් ක්‍රියාත්මක කර තිබුණ අතර, ලබා දී තිබූ පැල බොහොමයක් මිය යාම හේතුවෙන් ද, නිසි පුහුණුවක් ලබා නොදීම තුළින් අස්වනු නොමැතිවීම හේතුවෙන්ද, ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා රු.1,000,000ක වියදමින් ප්‍රතිලාභීන් 30 දෙනෙකු ඉලක්ක කර ඉදිකර තිබූ වගා ළිඳ ප්‍රතිලාභීන් 03 දෙනකු පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. | ඉන්ධන හා පොහොර හිඟය හේතුවෙන් මෙම වගාවන් සඳහා නිසි පරිදි ජලය හා පොහොර යෙදීමට නොහැකි වීම හේතුවෙන් පැල විනාශ වී ඇති බවත්, දැනට වගාවේ නඩත්තු කටයුතු සමඟ ඵලදාව හටගනිමින් පවතින බව ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි වී ඇති බවත් ළිඳ ආසන්නයේ ප්‍රතිලාභීන් තිදෙනා තම වගාවන් සඳහා ජලය ලබා ගන්නා බවත් දන්වා තිබුණි. | ව්‍යාපෘති ඵලදායී සහ අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඈ) | පඬුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාලව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය සඳහා ග්‍රාම නිලධාරී වසම් 03 කට අදාලව රු.4,988,176 ක වියදමින් වේවැල්, තල කොළ ආශ්‍රිත නිෂ්පාදනයන් හා මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන වශයෙන් ගම්මාන 03 ක් පිහිටුවා තිබුණ අතර, විවිධ ගැටලු හේතුවෙන් නිෂ්පාදන කටයුතු ප්‍රශස්ත මට්ටමකින් ක්‍රියාත්මක කර නොතිබුණ අතර, ලබාදී තිබුණ බොහෝ උපකරණ ඌණ උපයෝජිත තත්ත්වයේ පැවතුණි. | අඩුපාඩු අවම කර ගනිමින් මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සඳහා පසු විපරම් සිදුකර අවශ්‍ය සහාය ඔවුන් වෙත ලබාදීම සඳහා සංවර්ධන නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත. | ව්‍යාපෘතිය ඵලදායී ලෙස අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතු වීම සහ උපකරණ නිසි පරිදි භාවිතා කළ යුතුය. |
| (ඉ) | වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.3,474,096 ක වියදමින් ඇඟළුම් නිෂ්පාදන පොකුරු ගම්මාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණද, එය නිෂ්පාදන ගම්මාන සංකල්පයෙන් බැහැරව ස්වයං රැකියා ප්‍රවර්ධන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වී තිබුණි. එසේම ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක කළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ඉදි කරන ලද රු.2,929,178 ක ප්‍රවේශ | ප්‍රතිලාභී දායකත්වය ලබාදීමට නොහැකි බව දන්වා මෙම වසම්වල ප්‍රතිලාභීන් මැෂින් ලබාගැනීම ප්‍රතික්ෂේප කර ඇති නිසා සියලු ප්‍රතිලාභීන්ට උපකරණ ලබාගැනීමට නොහැකි විය. | ව්‍යාපෘති ඉටු කිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂමව සහ ඵලදායී ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාලීමට හැකිවන ආකාරයට ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මාර්ග වැඩසටහනේ ප්‍රතිලාභීන් ඉලක්ක කර සිදුකළ ව්‍යාපෘතියක් නොවුණි. | | |
| (ඊ) | රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ වසම් දෙකක් කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයක් හා සුළු අපනයන බෝග නිෂ්පාදන ගම්මානයක් වශයෙන් සංවර්ධනය කර තිබුණද, කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය සඳහා ලබාදී තිබුණ රු.1,478,519 ක් වටිනා කොහු නිෂ්පාදන යන්ත්‍රය, ලණු අඹරණ යන්ත්‍රය, ලණු බෝල කිරීමේ යන්ත්‍රය ආදී යන්ත්‍ර ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් කොහු නොමැති වීම හේතුවෙන් භාවිතයට නොගෙන ඌන උපයෝජිත තත්වයේ පැවතුණි. | මේ වන විට කොහු නිෂ්පාදන යන්ත්‍රය සවි කිරීම නිම කර තිබුණි. | ව්‍යාපෘති ඉටු කිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂමව සහ ඵලදායී ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාලීමට හැකිවන ආකාරයට ඉටු කළ යුතුය. |
| (උ) | රන්තැටිකන්ද සුළු අපනයන බෝග ප්‍රවර්ධන මධ්‍යස්ථානය සඳහා , රු.944,297 ක වියදමින් ඉදිකළ ගොඩනැගිල්ල සඳහා විදුලි පහසුකම් ලබාදී නොතිබීම මධ්‍යස්ථානය දක්වා ගමන් කිරීමට ඇති මාර්ග දුෂ්කරතාවයන් හේතුවෙන් මෙම මධ්‍යස්ථානය සඳහා ලබාදී තිබුණු රු.1,595,000 ක් වටිනා වියලීමේ යන්ත්‍රය හා රු.175,000 ක් වටිනා බීජ වෙන් කිරීමේ යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. එසේම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී මෙම තත්ත්වයන් සම්බන්ධ අවධානය යොමු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. | බීජ වියලනය කිරීමේ යන්ත්‍රය ගොඩනැගිල්ලේ සවිකර තිබෙන අතර, ඉදිරියේදී සුළු අපනයන බෝග වියලනය සඳහා භාවිතා කරන බව දන්වමි. | ව්‍යාපෘති ඉටු කිරීමේදී වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට ව්‍යාපෘති තෝරාගත යුතුය. |
| (ඌ) | මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාලව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ මිංහෙට්ටිය වසමේ බිත්තර වී නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියක් සඳහා රු.7,813,495 ක වියදම් දරා විවිධ උපකරණ ලබාදී තිබූ අතර මෙම උපකරණ භාවිතයට ගෙන තිබුණද, සාමාන්‍ය වී නිෂ්පාදනය හැර | ප්‍රමාණවත් පොහොර නොලැබීම, කෘමිනාශක වල් නාශක සපයා ගැනීමේ දුෂ්කරතාවය හා බිත්තර වී මිල අධික වීම වැනි දුෂ්කරතා හේතුවෙන් බිත්තර වී වගාවක් ලෙස තිබිය යුතු ගුණාත්මක භාවය හා වගාවේ ප්‍රමිතිය මුල සිටම නොතිබූ | ව්‍යාපෘති ඵලදායී ලෙස අරමුණු ඉටුවන ආකාරය ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අපේක්ෂිත පරිදි බිත්තර වී නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි. | නිසා කෘෂිකර්ම උපදේශකගේ නිර්දේශ නොලැබූ බැවින් සියලුම කුඹුරුවල සාමාන්‍ය වගාව සිදුකර තිබුණි. | |
| (එ) | වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.3,800,000 ක වියදමින් වදුරැස්ස, වැල්ගාල වසමේ ඇඟලුම් උප කොටස් මසා නිම කර දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණ අතර, ප්‍රතිලාභීන් බහුතරයකට නිෂ්පාදන කටයුතු හා තාක්ෂණ භාවිතය පිළිබඳ පුහුණු හැකියාව අවම මට්ටමක පැවතීම, තෝරාගත් ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම හා ප්‍රතිලාභීන් එකිනෙකා දුරින් සිටීම, ප්‍රවේශ මාර්ග නොමැති වීම වැනි හේතුන් නිසා ප්‍රමාණවත් නිෂ්පාදනයක් සිදුකිරීමට නොහැකි වී තිබුණි. | ප්‍රතිලාභීන් විසින් සමෘද්ධි දීමනාව අහිමි වේය යන බිය හේතුවෙන් ඇඟළුම් නිෂ්පාදනවලින් ලැබෙන ආදායම සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු හෙළිකර නොමැති බව අනාවරණය විය. | ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී නිසි ක්‍රමවේදයකට අනුව තෝරා ගත යුතුය. |
| (ඒ) | උඩුබද්දාව ප්‍රාද්ශීය ලේකම් කාර්යාලයට අදාලව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ කැකුණාවල වසමේ කුකුළු පාලන හා බිත්තර නිෂ්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.4,831,841 ක් වැයකර දිනක් වයසැති කුකුළු පැටවුන් බෙදාදී තිබූ මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගන්නා ලද ප්‍රතිලාභීන්ට කුකුළු කෑම හා බෙහෙත් සඳහා විශාල පිරිවැයක් දැරීමට අපහසුවීම මත කුකුළු පැටවුන් විශාල ප්‍රමාණයක් මියගොස් සිටි අතර, නැවත පැටවුන් යෙදීමටද ප්‍රතිලාභීන් අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. | කුකුළු පැටවුන් ලබාදීමේදී ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම මත දිනක් වයසැති පැටවු ලබා දී ඇති අතර, කුකුළු පැටවුන්ගේ නඩත්තුව කිරීම මුල සිටම කරගෙන යා යුතු බැවින් දිනක් වයසැති කුකුළු පැටවුන් ලබා ගැනීමට ලිඛිතව ඉල්ලීම් කර තිබූ අතර, පැටුවුන් මිය යාමට හේතු සෙවීම සඳහා පශු වෛද්‍ය කාර්යාලය වෙත යොමු කර උපදෙස් ලබා දී ඇත. | ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී නිසි ක්‍රමවේදයකට අනුව තෝරා ගත යුතුය. |
| (ඔ) | 2021 වර්ෂයේ සමෘද්ධි පවුල් ලක්ෂ 02 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක ප්‍රතිලාභීන් 38 දෙනෙකු වෙත රු.1,611,287 ක භාණ්ඩ හා උපකරණ ලබාදී තිබුණ අතර, එම ප්‍රතිලාභීන් වෙතම රු.1,119,888 ක වියදමින් | සවිබල ගැන්වීමේ අදහසින් ඉහළ ආදායම් ලබන ප්‍රතිලාභීන් 2021 වර්ෂයේ ජීවනෝපාය උපකරණ ලබාදීම සඳහා තෝරාගත් අතර, චක්‍රලේඛ උපදෙස් මත සහනාධාර ඉවත් කිරීමට | ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී නිසි ක්‍රමවේදයකට අනුව, වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට තෝරාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පසුගිය වර්ෂවලදීද විවිධ භාණ්ඩ ලබාදී ඇතත් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය වීමක් හෝ උසස්වීමක් සිදුවී ඇතිද යන්න පසුවිපරමකින් තොරව පසුගිය වර්ෂයන්හිදී ලබාදී ඇති ව්‍යාපෘති සඳහාම අවශ්‍ය වන භාණ්ඩ 2021 වර්ෂයේදීද ලබා දී තිබුණි. | නොහැකි වූ නිසා සවිබල ගැන්වීමට අපේක්ෂිත ලේඛනයට අතුළත් කර ඇත. | |
| (ඕ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රතිලාභීන් 28 දෙනෙකු වෙත ජීවනෝපාය ව්‍යාපෘතිය යටතේ 2015 – 2018 වර්ෂවල රු.513,765 ක වටිනාකමින් යුතු විවිධ උපකරණ ලබාදී තිබුණු අතර, 2021 වර්ෂයේදී එම ප්‍රතිලාභීන්ටම රු.1,006,197 ක් වටිනා උපකරණ ලබාදීමෙන් අදාල ප්‍රතිලාභීන් කිසිදු කර්මාන්තයක දීර්ඝකාලීනව නොයෙදෙනා බව තහවුරු වි තිබු අතර 2021 වර්ෂයේදීත් ප්‍රතිලාභ ලැබිය යුතු වෙනත් පාර්ශවයන් වෙත ප්‍රතිලාභ ලැබීම සීමා වී තිබුණි. | සවිබල ගැන්වීමේ අදහසින් ඉහළ ආදායම් ලබන ප්‍රතිලාභීන් 2021 වර්ෂයේ ජීවනෝපාය උපකරණ ලබාදීම සඳහා තෝරාගත් අතර, චක්‍රලේඛ උපදෙස් මත සහනාධාර ඉවත් කිරීමට නොහැකි වූ නිසා සවිබල ගැන්වීමට අපේක්ෂිත ලේඛනයට අතුළත් කර ඇත. | ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී නිසි ක්‍රමවේදයකට අනුව, වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට තෝරාගත යුතුය. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- | නිර්දේශය<br>--------------- |
|---|---|---|
| කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අයත් මොන්නැකුලම සේවා පියස කාර්යාලයට ඒකාබද්ධව තැපැල් කාර්යාලය හා සමුපකාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහාරු.1,000,000 ක ඇස්තමේන්තුවක් යටතේ රු.970,000 ක් වැයකර ඉදිකිරීම් කටයුතු කොන්ක්‍රීට් කුළුණු සකස් කිරීමට පමණක් සීමා වී තිබූ අතර මෙම ඉදිකිරීම් කටයුතු අවසන් වී වසරක් පමණ ගතවී තිබුණ ද, ගොඩනැගිල්ල හා අවට භූමිය කැලෑවෙන් වැසී කොන්ක්‍රීට් කුළුණු සඳහා යොදා ඇති කම්බි මලකඩ සහිතව දිරායාමට ලක්වෙමින් තිබුණි. | ග්‍රාමීය කම්ටුවේදී නිකවැරටිය විවිධ සේවා සමූපකාර සමිතිය පොරොන්දු වූ පරිදි මේ වන විට ව්‍යාපෘති දෙකේම ඒකාබද්ධ ඉදිකිරීම් නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ඉදිකිරීම් ව්‍යාපෘති ඵලදායී ලෙස අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | --------------------------- | ------------- |
| (අ) | 2022 වර්ෂයේ ක්‍රීඩා පාසැල් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ තරුණ කටයුතු ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.20,382,595 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබා දී තිබූ අතර, මෙම මුදලින් රු.19,186,942 ක වියදමක් දරා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය බොරළු දමා තැලීම පමණක් සිදුකර ඇති බැවින්, මෙම ක්‍රීඩාපිටිය සිසුන්ට භාවිතා කළ නොහැකි මට්ටමේ පැවතිම හේතුවෙන් සහ එසේම ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘතිය අවසන් කර නොතිබීම හේතුවෙන් ක්‍රීඩා පාසැලක් වන විද්‍යාලයේ ක්‍රීඩා කටයුතු මේ වන විටත් අඩපන වී තිබුණි. | 2022 වර්ෂය අවසාන වන විට රු.මි.19.18 ක් වියදම් දැරීම මඟින් බොරළු හා පස් තැලීම සිදුකර ඇති අතර, ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා රු.මි.24.875 ක ප්‍රතිපාදන අනුමත වී ඇත. | ඉදිකිරීම් ව්‍යාපෘතිය සැලසුම් කරන ලද ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ග්‍රාමීය පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නීරාලියද්ද වොලිබෝල් ක්‍රීඩාංගනය රු.1,500,000 ක ඇස්තමේන්තුගත වටිනාකමක් යටතේ ඉදිකර ඇතත්, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ක්‍රීඩාංගනය වටා දැල් ගැසීමක් සිදුකර නොතිබුණ අතර, පරීක්ෂා කරන අවස්ථාව වන විටත් ක්‍රීඩා කටයුතු සඳහා යොදා නොගෙන මඤ්ඤොක්කා වගාවක් ක්‍රීඩාංගනය ඇතුළත සිදුකර තිබුණි. | රටේ පැවති අයහපත් ආර්ථික අර්බුදය හමුවේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමේ වැඩසටහනකට අනුව මෙම ක්‍රීඩා භූමිය වටා මඤ්ඤොක්කා වගාකර තිබුණි. | ඉදිකිරීම් ව්‍යාපාති ඵලදායී ලෙස අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ග්‍රාමීය ආර්ථික බෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 ක | වැඩි ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබාදීම සඳහා අක්කරයකට බීජ කි.ග්‍රෑ.8 ක් පමණක් ලබාදුන් අතර, කාලගුණික තත්ත්වය මත ලැබුණු අස්වැන්න විශාල | ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණ අපේක්ෂිත ආකාරයට ව්‍යාපෘති |

| | | |
|---|---|---|
| රු.1,939,350 ක වටිනාකමින් යුතුව මුං බෝගය වගා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබූ අතර වර්ෂය අවසානය වන විට වගා අපේක්ෂාව වූ අක්කර 231 කින් සියයට 26 ක් වන අක්කර 60 ක පමණ භූමි ප්‍රමාණයක් වගා හානි ලක්වීම හා වගාවට භාවිතා නොකිරිම හේතුවෙන් අපේක්ෂිත අස්වැන්න වූ මුං බීජ කි.ග්‍රෑ.82,720 කින් සියයට 25 ක් පමණ වන බීජ කි.ග්‍රෑ.21,009 ක පමණ අස්වැන්නක් ලැබී තිබුණි. | ලෙස අඩු වූ බැවින් අපේක්ෂිත අස්වැන්න ලබාගත නොහැකි වුවත් ලැබී ඇති අස්වැන්නේ වටිනාකම සැලකූ විට මූල්‍යමය පාඩුවක් සිදුවී නොතිබුණි. | ඉටුකළ යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උඩුබද්දාව, කුලියාපිටිය (නැගෙනහිර), මාස්පොත, මල්ලවපිටිය, පඩුවස්නුවර (නැගෙනහිර), ගල්ගමුව හා රස්නායකපුර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හි කාර්යාල ආරම්භ කර වර්ෂ 14 සිට වර්ෂ 59 දක්වා කාලයක් ඉක්ම ගොස් ඇතත්, එම කාර්යාල පිහිටි ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනිම සම්බන්ධයෙන් කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම්වරු විසින් දන්වා ඇත. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම් නීත්‍යානුකූලව පවරාගත යුතුය. |
| (ආ) | ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජයන්තිපුර ග්‍රාම නිලධාරී වසමේ රාජංගනය යාය 04 හි පිහිටි කලාඔය දූපතේ හෙක්ටයාර 49.6122 ක ඉඩමෙන් (අක්කර 124.0305) කොටසක් අනවසර පදිංචිකරුවන් 07 දෙනෙකු විසින් සහ ස්වාමීන් වහන්සේ නමක් විසින් අනවසරයෙන් අල්ලාගෙන භුක්ති විදිමින් තිබූ අතර, එසේම මෙම ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ රක්ෂිත භූමියක් ලෙස නම් කිරීමට තීරණය කිරිම සඳහා ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකර වසරකට වැඩි කාලයක් ගතවී ඇතත්, එමගින්ද නිශ්චිත විසඳුමක් ලැබී නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් 07 ක් සඳහා නඩු 07 ක් ගොනු කර ඇති අතර, නඩු කටයුතු අවසන් වන තෙක් ඉඩම පිළිබඳව කටයුතු කිරීම නැවතී ඇත. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 52-5707 දරන රථයේ 2011 මැයි 20 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් වූ අලාභ හානිය රු.114,650 ක් ලෙස හඳුනාගෙන තිබුණ අතර, අනතුර සිදුවී වර්ෂ 12 ක් ගත වී ඇතත්, අදාල පාර්ශවවලින් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, එම අනතුරෙන් පසු රථය අලුත්වැඩියා කර ධාවනයට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලාභය අයකර ගැනිම සඳහා කුලියාපිටිය පොලිසිය මගින් කුලියාපිටිය දිසා අධිකරණයේ පවරා ඇති නඩුව අවසන් වී නොතිබුණි. | නිශ්කාර්යව පවතින වාහන පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. |
| (ඈ) | ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සඳගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාතෘ සායනය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.1,150,000 ක මුදලින් සකස් කර එයට ලබාදී තිබුණු පුටු ඇතුළු උපකරණද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අදාල මාතෘ සායනය අත්හැර දමා තිබුණි. | සඳගල සායන මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයට කි.මී.4 ක් දුරින් සෝලේවැව තවත් සායන මධ්‍යස්ථානයක් පවතින බැවින් මෙම මධ්‍යස්ථානය බර කිරන ස්ථානයක් ලෙස භාවිතා කරනු ලැබේ. | නිශ්කාර්යව පවතින උපකරණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අයත් ගොඩනැගිලි 71 ක් හා ඊට අයත් ඉඩම් කොටස් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | නිශ්කාර්යව පවතින වත්කම් ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පැවතුණි. | නිශ්කාර්යව පවතින දේපළ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |
| (ඊ) | මාවතගම ප්‍රාදේශීය ලේකම්වරයා විශ්‍රාම යන අවස්ථාවේදී ගබඩා භාණ්ඩ ආපසු භාරදෙන විට ලබාදී තිබූ ටැබ්ලට් පරිගණකය වෙනුවට පාවිච්චියට ගත නොහැකි වෙනත් පරිගණකයක් ලබාදී ඇති බව තාක්ෂණික වාර්තා මඟින් තහවුරු වී ඇතත් නියමිත ටැබ්ලට් පරිගණක යන්ත්‍රය නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණයක් සිදුකිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු සිදුකර තිබුණි. | ටැබ්ලට් පරිගණක යන්ත්‍රය නැවත ලබාගත යුතු වීම සහ විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කොක්මඩුව හා ඔරුගල ග්‍රාම නිලධාරී වසම්වල රාජාංගනය ජලාශයට අයත් ජල පෝෂිත ප්‍රදේශයේ පුද්ගලයන් | පරීක්ෂණයක් සිදු කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු සිදුකර ඇත. | අනවසර පදිංචි කරුවන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 65 දෙනෙකු අනවසරයෙන් පදිංචි වී සිටින අතර, මැනුම් කටයුතු කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ කටයුතු කිරීමේ ප්‍රමාදයක් පැවතුණි. | | |
| (ඌ) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ඇති කුරුණෑගල නාගරික සීමාව තුළ පිහිටි රජය සතු ඉතා වටිනකමැති දේපළ 26 ක් කුරුණෑගල මහ නගර සභාවට පවරාදෙන ලෙස ඉල්ලා තිබූ අතර, ඒවා විධිමත් පරිදි පැවරීමක් සිදුකර නොතිබුණි. එසේම මෙම දේපළවලින් බොහෝමයක් වාණිජ පරමාර්ථයෙන් පවරා ගැනීම සඳහා ඉල්ලා තිබූ අතර, මේවා දිගු කාලීන බදු පදනම මත ලබාදී රජයට ආදායමක් උපයාගත හැකිව තිබියදී, මේ සම්බන්ධයෙන් නිසි අවධානය යොමුකර නොතිබුණි. | කුරුණෑගල මහා නගර සභාවට පැවරිය හැකි දේපළ පවරා දීමටත් අනෙකුත් දේපළ දිගු කාලීන බදුදීමේ හැකියාවක් ඇති බැවින් ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | රජය සතු වටිනා දේපළ පැවරීමේදී ඒ ගැන සොයා බලා පැවරිය යුතු දේපළ පමණක් විධිමත් පරිදි පැවරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (එ) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි හකුරුකැටියාව කටුවාවේවත්ත නමැති පර්චස් 109.77 ක රජයේ ඉඩමේ වසර ගණනාවක සිට පවුල් 17 ක් අනවසරව පදිංචි වී ඔවුන් විසින් අනවසර ඉදිකිරීම්ද සිදුකර ඇතත්, විගණන දින වන විටත් මේ සම්බනධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනවසරයෙන් පදිංචි වී සිටින පුද්ගලයින්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | රජයට අයත් ඉඩම් අනවසර පදිංචි කරුවන් අල්ලා ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.7 පාඩු හා හානි**

------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------ | -------------- |
| බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්ගම පත්තුව කෝරලේ 1201-වැදණ්ඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දික්වැහැර ග්‍රාමයේ අංක 47/19/1 මු.පි.කු 1326 දරන පිඹුරෙහි අංක 54 දරන කොස් කැලය නමැති බිම් කැබැල්ල ප්‍රදාන පත්‍ර හිමිකරු විසින් පෞද්ගලික සන්නිවේදන කුළුණක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී සමාගමක් වෙත ලබාදී | සන්නිවේදන කුළුණ ඉදිකර ඇති කොටස දීර්ඝකාලීන බදු පදනම යටතේ අදාල සමාගම වෙත පවරා දීමටත් දැනට මෙමම ඉඩම රජයට පවරා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | රජයට සිදුවී ඇති අලාභය අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

තිබුණ බැවින්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ 2018 ජූලි 16 දිනැති අංක 2007/3(iii) චක්‍රලේඛය ප්‍රකාරව අදාල කොටස නැවත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරාගෙන නොතිබීම හේතුවෙන් රු.1,015,000 ක ගණනය කළ අලාභයක් රජයට සිදුවී තිබුණි.

## 3.8 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බහුකාර්ය සංවර්ධන සහායකයින් නිත්‍ය පදනම මත ඒ ඒ ස්ථානවලට අනුයුක්ත කළ යුතු වුවද, පඩුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බහුකාර්ය සංවර්ධන සහායිකාවන් ඔවුන් අනුයුක්ත කළ ස්ථාන 03 ක සේවයට වාර්තා කිරීම ප්‍රතික්ෂේප කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැඳී සිටීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එකතුව රු.810,000 ක දීමනා ගෙවා තිබුණි. | වයඹ පළාත් බහුකාර්ය අධ්‍යක්ෂකගේ උපදෙස් අනුව සංශෝධන තාවකාලිකව නවතා ඇති බැවින්, වෙනත් ස්ථානයකට අනුයුක්ත කරන තුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය සඳහා යොදවා තිබුණි. | බහුකාර්ය සංවර්ධන සහායකයින්ගෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය. |
| (ආ) | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2020 දෙසැම්බර් 21 දිනැති අංක.WDM/SEVI/17/3 දරන ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතූ ලිපිය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රවල ආරක්ෂක හා සනීපාරක්ෂක සේවාවන් ලබාගැනීම සඳහා දැනට ක්‍රියාත්මක බහුකාර්ය සංවර්ධන සහායකයින් ඉදිරියේදී යෙදවීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණද, රිදීගම, ඇහැටුවැව, පඩුවස්නුවර (නැගෙනහිර) හා කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිත්‍ය පදනම මත අනුයුක්ත කර තිබූ සහායකයින් 40 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේදී එම කාර්යයන් ඉටුකරවා නොගෙන දීමනා වශයෙන් රු.10,800,000 ක | බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් මේ වන තෙක් ස්ථිර කර සේවයේ යොදවා නොමැති බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලන්හි ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා පිළිබඳ වගකීම මෙම සහායකයින් වෙත පැවරීමට නොහැකි බව දන්වමි. | බහුකාර්ය සංවර්ධන සහායකයින්ගෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය. |

මුදලක් ගෙවා තිබුණ මෙම සහායකයින් උක්ත කාර්යයන් සඳහා යෙදවාගත හැකිව තිබියදීත්, පෞද්ගලික ආයතන වෙත රු.4,820,993 ක මුදලක් එම සේවාවන් ඉටුකිරීම වෙනුවෙන් ගෙවා තිබුණි.

**3.9 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාම ශක්ති ව්‍යාපාරය යටතේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ අදියර I සහ II ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කළ මුදල රු.52,434,455 ක් වූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට වියදම් කර ඇති මුදල රු.15,507,338 ක් විය. ඒ අනුව මුදලින් ඉතිරිය රු.36,927,117 ක් වීමෙන් ග්‍රාම සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම අවම මට්ටමක පැවතුණි. | කොවිඞ් වසංගතය පැවති සමයේ අතපසු වූ කාර්යයන් කඩිනම් කිරීමට සහ අදාල පුහුණු වැඩසටහන් කිරීමට සියලුම ප්‍රාදේශීය ලේකම්වරු දැනටමත් කටයුතු කර ඇති අතර, මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන කාල සීමාව පුරාවට ජනතාවගේ අවශ්‍යතාවය අනුව පමණක් වැයකළ යුතු බැවින්, එකවර වියදම් කළ නොහැකි විය. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ වෙන්කරන ලද මුදල් නිසි පරිදි ප්‍රතිලාභීන් සඳහා ලබාදිය යුතුය. |
| (ආ) | ධාරිතා සංවර්ධනය වෙනුවෙන් ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම හැකියාවන් ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට රු.10,429,432 ක් මුදලක් වෙන්කර තිබූ නමුත් වැයකර තිබුණේ රු.792,510 ක මුදලක් විය. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ලබාදුන් ප්‍රතිපාදනවලින් ධාරිතා සංවර්ධනය සඳහා උපරිම ලෙස ප්‍රයෝජනයට නොගෙන රු.9,636,922 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | ධාරිතා සංවර්ධනය වෙනුවෙන් සමස්ථ සංවිධානවල සාමාජිකයන්ගේ හැකියාව වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය භාණ්ඩ හා ලිපිද්‍රව්‍ය ලබා ගැනීමටත්, පුහුණු වැඩසටහන් සඳහාත් මෙම අරමුදල් යොදා ගැනීමට හැකි බවත් ධාරිතා සංවර්ධනය සඳහා පෙර වෙන්කර ඇති සියයට 30 ප්‍රතිශතය සියයට 15 දක්වා අඩු කිරීමටත් උපදෙස් | නිශ්ක්‍රීයව පවතින මුදල් ප්‍රතිලාභීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා උපරිම ලෙස යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලබා දී ඇති අතර, මේ වන විට ප්‍රාදේශීය ලේකම්වරු ඒ අනුව කටයුතු කරමින් පවතී. | |
| (ඇ) | ජීවනෝපාය සංවර්ධනය යටතේ ව්‍යවසාය සංවර්ධන අරමුදල සඳහා වෙන්කළ මුදල රු.14,200,007 ක් වුවද, වියදම් කර තිබුණේ රු.3,529,382 ක් වූ බැවින්, ප්‍රයෝජනයට නොගෙන ප්‍රතිපාදනයෙන් සියයට 75 ක් රු.10,670,625 ක් ඉතිරි වී තිබුණි. | ව්‍යවසාය සංවර්ධන අරමුදලේ ඉතිරි මුදල් වැයකිරීම සඳහා අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර ඇත. | ජීවනෝපාය සංවර්ධනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඈ) | ව්‍යවසාය සංවර්ධනය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක් තුළ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.7,405,015 ක මුදලක් වෙන්කර තිබුණද, කිසිදු ප්‍රයෝජනයකට නොගෙන එම මුදල ඉතිරිව පැවතුණි. | මෙම මුදල් සම්බන්ධව වැඩිදුර උපදෙස් ලබාගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර තිබුණි. | ව්‍යවසාය සංවර්ධනය සඳහා වෙන්කරන ප්‍රතිපාදන උපරිම ලෙස ප්ර්යෝජනයට ගත යුතුය. |
| (ඉ) | ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ අදියර I සහ II සඳහා වෙන්කළ මුදල රු.115,346,839 ක් වූ අතර, මෙයින් රු.68,517,082 ක් ණය වැඩසටහන් සඳහා වැයකර තිබූ අතර, ප්‍රතිපාදනයෙන් සියයට 41 ක් ඉතිරිය රු.46,829,757 ක් විය. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ක් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 74 ක් සඳහා රු.21,470,579 ක ණය මුදලක් ලබාදීම සඳහා වෙන්කර තිබුණද, අදාල ණය වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන ඉතා ඉක්මනින් ආරම්භ කරන බව සහ 2023 වර්ෂය සඳහා ණය ලබාදීමට ණය ඇහයීම් කටයුතු සිදුකරමින් පවතී | ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් විධිමත් පරිදි ණය වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් අඩු ආදායම්ලාභී වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබූ ණය වැඩසටහනට අනුව, විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 ක ක්‍රියාත්මක මෙම ණය වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සහ විෂයයට අදාල නිලධාරීන් නොමැතිකමින්ද ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාල ගිණුම් අක්‍රීය වි තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් සඳහා ලබාදුන් රු.1,452,700 ක ණය වැඩසටහන් ක්‍රියාත්මක නොවන අතර, අදාල ගිණුම් අක්‍රීය වී තිබුණි. | මෙම වැඩසටහන මුල් අදියරයන් තුළ සියයට 50 ක් ආපසු අයකර ගැනීමේ පදනම මත ක්‍රියාත්මක වූ අතර, එම සියයට 50 අය නොකර ආධාර වැඩසටහන් යටතේ ලබා දී තිබූ බැංකු ශේෂය ආධාර ලබාදීමට තරම් ප්‍රමාණවත් නොවන විට ප්‍රාදේශීය කාන්තා බල මණ්ඩල ගිණුම්වට බැර කිරීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට උපදෙස් ලබාදී ඇති අතර, නිලධාරී පුරප්පාඩු සඳහා වැඩ බැලීම සඳහා නිලධාරීන් පත්කර එම වැඩසටහන සක්‍රීය කිරීමට කටයුතු කරනු ඇත. | කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා ණය වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) | මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක.MF/NPD/01/2021 දරන සහ 2021 ජනවාරි 11 දිනැති චක්‍රලේඛයේ සඳහන් පරිදි 2021 විමධ්‍යගත අයවැය වැඩසටහනේ ප්‍රධාන අරමුණ ග්‍රාමීය සංවර්ධනය තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කර සාර්ව ආර්ථික ඉලක්කයන් සපුරා ගැනීම වුවද, චක්‍රලේඛයේ සඳහන් අපේක්ෂිත ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු නොකර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක ලියාපදිංචි සමිති හා ප්‍රජාමූල සංවිධාන සඳහා භාණ්ඩ හා උපකරණ සැපයීම කෙරෙහි ඉහළ ප්‍රමුඛතාවයක් දක්වා තිබූ අතර, මෙය මුළු විමධ්‍යගත ප්‍රතිපාදන වියදම වූ රු.88,241,505 න් රු.41,091,394 ක මුදලක් එනම් සියයට 47 ක ප්‍රතිශතයක් විය. එ් අනුව ලියාපදිංචි සමිති හා ප්‍රජාමූල සංවිධාන සඳහා භාණ්ඩ හා උපකරණ ලබාදීම සඳහා දහම් පාසල් හා පන්සල් සංවර්ධනය, පෙර පාසල් සංවර්ධනය හා ලියාපදිංචි සමිති සඳහා භාණ්ඩ | ප්‍රතිපාදන බෙදීයන ලෙස ව්‍යාපෘති තෝරාගෙන ක්‍රියාත්මක කළ යුතුබව චක්‍රලේඛයේ සඳහන්ව ඇතත්, අදාල යෝජනාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අභිමතය පරිදි ඉදිරිපත් කරනු ඇත. | චක්‍රලේඛයේ සඳහන් අපේක්ෂිත ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කිරීමට සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බෙදා දීම් වෙනුවෙන් රු.65,882,099 ක් එනම් සියයට 75 ක් වැයකර තිබුණි. | | |
| (ඌ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 කට අදාලව පසුගිය වර්ෂ 03 ක කාලපරිච්ඡේදය තුළ වන අලි හානි සඳහා එකතුව රු.10,574,971 ක් දේපළ, ශාරීරික හා ජීවිත හානි වශයෙන් වන්දි මුදල් පිරිනමා තිබුණද, පසුගිය කාලපරිච්ඡේදයට අදාලව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වන අලි ගැටලුවලට විසඳුම් ලබාගත හැකි සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | මෑත කාලීනව සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමේදී එහි නායකත්වය දේශපාලන අධිකාරිය සතු වීම සහ ගැටලුකාරී ව්‍යාපෘති ඉටුකිරීමට ප්‍රමාණවත් මුදල් වෙන් නොවීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී ඇති අතර, වන අලි උවදුර පාලනය කිරීම සඳහා යම් ක්‍රියාමාර්ග ගනු ඇත. | සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වන අලි උවදුර විසඳීම සඳහා පියවර ගත යුතුය. |
| (එ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ප්‍රතිලාභීන් 54 ක් සඳහා වර්ෂ 02 සිට 25 දක්වා කාලයක් රු.9,267,408 ක වටිනාකම් සමෘද්ධි සහනාධාර ඇතුළු අනෙකුත් සහනාධාර මඟින් ජීවනෝපාය සංවර්ධනය වී ඇති බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමෘද්ධි අංශය මඟින් හඳුනාගෙන ඇතත්, එම ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි සහනාධාරය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | තවදුරටත් පුද්ගල ආදායම් මට්ටම පිළිබඳව වඩාත් සැලකිලිමත් බවක් දක්වා කටයුතු සිදු කරන ලෙසට ග්‍රාමීය කමිටුු වලට දන්වා ඇති අතර, ඇතුළු ප්‍රතිලාභීන් හට රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය මත ව්‍යාපෘති කිරීමට අපහසු බැවින් සහනාධාර ඉවත් කර නොමැති බවත්, මෙම වසර තුළ ප්රතිලාභීන් සවිබල ගන්වා සහනාධාර ක්‍රියාවලියෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිටින සමෘද්ධි ලාභීන් සමෘද්ධිමත් වූ පසු විධිමත් පරිදි හඳුනාගෙන ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඒ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ප්‍රතිලාභීන් 10 ක් වෙත සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ලබාදී තිබූ රු.574,935 ක වටිනා උපකරණ භාවිතයට ගෙන කිසිදු ජීවනෝපාය සංවර්ධන කටයුත්තක නිරත නොවන බැවින් එම යන්ත්‍ර හා උපකරණ ආපසු | මෙම උපකරණ කලාපය තුළ සිටින සුදුසු ප්‍රතිලාභීන්ට ග්‍රාමීය කමිටුවේ අනුමැතියට යටත්ව ඉදිරියේදී ලබාදීමට කටයුතු යොදා ඇත. | ලබාදුන් ප්‍රතිපාදනවලින් විධිමත් පරිදි උපයෝජනයක් සිදුවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| ලබාගෙන සුදුසු ප්‍රතිලාභීන් වෙත ලබාදීමට හෝ රජයේ දායකත්වය අය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඔ) ක්ෂේත්‍ර ගත රාජකාරිවල නිරත ක්ෂේත්‍ර නිලධාරින් විසින් අදාල මාසයේ ඉදිරි වැඩසටහන ඊට පෙර මාසයේ 25 දිනට පෙර මාණ්ඩලික නිලධාරි වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු අතර, ඒ ඒ මාසයේ කළ වැඩසටහන් ඊට පසු මාසයේ 05 වන දිනට පෙර මාණ්ඩලික නිලධාරි වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාලව පවත්වා ගෙන යනු ලබන ලේඛන හා ඉදිරි/ කළ වැඩසටහන් ලිපිගොනුවලට අනුව නිලධාරින් 34 දෙනෙකු මාස 01 - මාස 09 ක කාලයක් සඳහා ඉදිරි වැඩසටහන් ද, නිලධාරින් 101 දෙනෙකු මාස 01 - මාස 07 ත් අතර කාලයක් සඳහා කළ වැඩසටහන්ද ඉදිරිපත් කර නොතිබුණු බැවින්, එම නිලධාරින් වෙත ගමන් වියදම් ගෙවීම් කලේ කුමන පදනමකින්ද යන්න විගණනයේදී සනාථ නොවුණි. | මින් ඉදිරියට එසේ නොවීමට කටයුතු කරන බැවින් අදාල නිලධාරීන් සියලු දෙනා දැනුවත් කර ඇති බවත් ඉදිරි හා කළ වැඩසටහන් නියමිත දිනට පෙර ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දී තිබුණි.ෙ | ඉදිරි වැඩසටහන් සහ කළවැඩසටහන් නියමිත දිනට පෙර ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.10 අමාත්‍ය මණ්ඩල තීරණවලින් බැහැරවීම

---------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------------------- - | ------------ |
| 2022 මහ කන්නය සඳහා පරිසර හිතකාමී පොහොරවල මිල ගණන් සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් 2022 නොවැම්බර් 01 දිනැති අංක OF/79/2022 සංදේශය මඟින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර තිබූ | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි මඟින් සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන අමතා පරිසර හිතකාමී පොහොර සැපයුම්කරුවන් වෙත මුදල් ගෙවන ලෙස දන්වා | අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

අතර, එයට අදාලව මුදල්, ආර්ථික ස්ථායීකරණය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ 2022 නොවැම්බර් 17 දිනැති අංක.DF/D/CO/2022-19 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාලව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ අංක 1 අනුව සැපයුම්කරුවන් සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශ මත ගෙවීම්, අමාත්‍යාංශ මට්ටමින් සිදුකළ යුතු බව දක්වා තිබුණි. ඒ අනුව 2022 නොවැම්බර් 21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1745/612/013-1 හි සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණ (II) (ඇ) අනුව, ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා තෝරාගත් පරිසර හිතකාමී පොහොර සැපයුම්කරුවන් විසින් සපයනු ලබන පොහොර සඳහා වන ගෙවීම්, අදාල දිස්ත්‍රික් ලේකම් / දිසාපතිගේ නිර්දේශ මත කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් නිරවුල් කිරීමට හැකිවන පරිදි යෝග්‍ය වැඩපිළිවෙලක් හඳුන්වාදීම මගින් සිදුවිය යුතු බව දක්වා තිබුණි. එසේ වුවද, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ 2022 ඔක්තෝබර් 10 දිනැති අංක.SMA/ACC/11/Fertilizer දරන ලිපිය මගින් ගෙවීම් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත රු.823,481,050 ක මුදලක් ලබාදී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ මත ගෙවීම් කටයුතු කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදුකළ යුතු වුවද, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් විසින් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන පරිදි පරිසර හිතකාමී පොහොර සැපයුම්කරුවන් 12 දෙනෙකු වෙත රු.205,000,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. නැවත වරක් කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් 2023 මාර්තු 29 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබූ අතර, ඒ සඳහා 2023 අප්‍රේල් 26 දින දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ගෙවීම් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබුණද, ඉහත මුදල ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී නොතිබුණි.

තිබුණි.

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------- | -------------- |
| (අ) | රාජ්‍ය මූල්‍ය ප්‍රමුඛතා අනුව සැලකූ මධ්‍යකාලීන සාර්ව මූල්‍ය රාමුව හා ඇස්තමේන්තුගත සම්පත් සමඟ අයවැය ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීම මෙන්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ අයවැය වෙන්කිරීම් හා වියදම් පෙළ ගැස්වීමක් සිදු කර නොතිබුණ අතර, කාර්යසාධනය මත පදනම්ව අයවැයකරණ ක්‍රමවේදයක් සිදු කර නොමැතිව වාර්ෂිකව සපුරාගන්නා ඉලක්ක පමණක් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රගතිය ලෙස දක්වා තිබුණි. | අරමුණු 14 සහ 17 දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වීමට අපහසු වන අතර, ඒ සඳහා ජාතික මට්ටමින් ක්‍රියාත්මක විය යුතු බැවින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව හැකිතාක් දුරට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | බොහෝ තිරසර අරමුණු ඉටුකිරීමේ මූල්‍ය ප්‍රගතිය දක්වා තිබුණද, මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික ප්‍රගතිය හා ලබාගත් ජයග්‍රහණවල තිරසාරත්වය එයින් නිරීක්ෂණය කළ නොහැකි වීමෙන් ඉටු කළ කාර්යයන් මඟින් තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය තහවුරු කරගත නොහැකි විය. | අමාත්‍යාංශවලින් ලැබෙන ප්‍රතිපාදන වෙන් කිරීම සිදු වන අතර, රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා අනුව අයවැය වෙන් කිරීම සිදු කිරීමට මෙම කාර්යාලයේ සීමාවන් තුළ සිදුකළ නොහැකි විය. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව තිරසර සංවර්ධන අරමුණු 17 ක් වෙනුවෙන් ක්‍රියාකාරකම් 210 ක් ක්‍රියාත්මක කිරීමට අරමුණු කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී ක්‍රියාත්මක කර තිබුණේ ක්‍රියාකාරකම් 163 ක් පමණි. | සීමිත ප්‍රතිපාදන තුළින් මෙම තිරසර සංවර්ධන අරමුණු 17 ඉටු කිරීමේ ප්‍රගතිය, බලාපොරොත්තු වන ජාතික මට්ටමේ අරමුණු ළඟා කර ගැනීමට දිස්ත්‍රික් මට්ටමින් උපරිම දායකත්වය ලබාදීමට කටයුතු කරමි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීම හැකිතාක් දුරටත් ක්‍රියාත්මක කළ යුතුය. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක සම්පත් පැතිකඩ අනුව, විදුලි රහිත නිවාස 2,856 ක්, වැසිකිලි නොමැති නිවාස 4,990ක්, වල වැසිකිලි සහිත නිවාස 2,314 ක්, තාවකාලික නිවාස 2,961 ක් සහ පදිංචියට නිවසක් නැති පවුල් 2,851 ක් පැවතියදී, 2021 පෙබරවාරි 10 දිනැති අංක.MF/ NPD/01/2021(i) දරන මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ 1.13 වගන්තිය ප්‍රකාරව සනීපාරක්ෂක පහසුකම් නොමැති නිවාස සඳහා වැසිකිලි පහසුකම් ඇති කිරීම, ස්ථිර නිවාස සඳහා විදුලි පහසුකම් ඇති කිරීම හා පානීය ජල සම්බන්ධතා ලබාදීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් සඳහා රු.88,241,505 ක ලැබූ ප්‍රතිපාදන මුදලින් සියයට 01 ක් වූ රු.746,960 ක් වන මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. | එක් එක් සංරචක සඳහා වෙන් කළ යුතු ප්‍රතිශතයන් මෙම චක්‍රලේඛයෙන් දැනුම් දී නොමැති බැවින්, දේශපාලන අධිකාරියේ තීරණවලට අනුව ඉදිරිපත් කරන යෝජනා ප්‍රතික්ෂේප කිරීමේ හැකියාවක් නොමැති විය. | ලබාදුන් ප්‍රතිපාදනවලින් ව්‍යාපෘති කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ප්‍රාථමික මට්ටමේ පිළිවෙලින් තිදෙනෙකු, විසි දෙදෙනකු හා විසි දෙදෙනකු බැගින් තනතුරු පුරප්පාඩු පැවති අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සෑම මසකම පළමු දින හා පහලොස්වන දින MOHA දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම මඟින් අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර, පුරප්පාඩු සම්බන්ධයෙන් තොරතුරු සෑම දිසාපති | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සමුළුවක් සඳහාම දන්වා තිබුණි. | |
| (ආ) | ද්විතියික මට්ටමේ සංවර්ධන නිලධාරී තනතුරේ නිලධාරින් 217 ක් අතිරික්තව පැවතුණි. | නව තනතුරු සඳහා 2022 දෙසැම්බර් 31 වන තෙක් අනුමැතිය ලැබී නොමැති බැවින් සංවර්ධන නිලධාරී තනතුරේ නිලධාරින් 217 ක අතිරික්තයක් පෙන්නුම් කර ඇත. | අතිරික්ත නිලධාරීන් සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | විධායක ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ සැලසුම් තනතුරු 02ක්ද, ද්විතීක ශ්‍රේණියේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් තනතුරු 04 ක්ද, පරිපාලන කිලධාරි තනතුරු 10 ක්ද, පරිපාලන ග්‍රාම නාලධාරි තනතුරු 8ක්ද වශයෙන් තනතුරු 24ක ප්‍රමාණයක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම පුරප්පාඩු සම්බන්ධව සියලු තොරතුරු අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර, අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරු, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවෙන් සම්පූර්ණ කරන අතර, පරිපාලන නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර නොමැති අතර, පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරු පු◌ුරප්පාඩු පිළිබඳව අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. | පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |